---

**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**අනුරාධපුර දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 ජුනි 14 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 දෙසැම්බර් 12 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). එකතුව රු.1,418,045 ක්වූ පුස්තකාල පොත්, කාර්යාල උපකරණ, බේකරි උපකරණ හා යන්ත්‍රෝපකරණවල වටිනාකම ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ). වර්ෂ අවසානයේ පැවැති එකතු වටිනාකම රු.24, 886 ක් වූ ඉතිරි ලිපි ද්‍රව්‍ය හා ඉන්ධන තොගය ඉතිරි තොග ලෙස ගිණුම් වල දක්වා නොතිබුණි.

(ඇ). ආදානාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් රු.4,917,315 ක්වූ ණය මුදල වගකීමක් ලෙසද ආදානාගාරය ඉදි කිරීමේ මුළු පිරිවැයවූ රු.14,900,957 ක් ස්ථාවර වත්කම් ලෙසද ගිණුම් ගත කර නොතිබුණි.

**1.3.2 නොසැසඳූ ගිණුම්**

ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු ශේෂයන් සහ ඒවාට ආදාල උපයෝගි ලේඛණවල දැක්වෙන ශේෂයන් අතර රු.2,763,599 ක වෙනසක් දැක්වුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.12,630,559 ක්වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේ දි සතුටුදායක ලෙස සනොයක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.234,177 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1, 837,398 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන ඌනතා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 99ට පටහැනිව එකතුව රු.380,316 ක්වූ වවුචර් 24 ක් සහතික කිරීමෙන් තොරව ගෙවා තිබුණි.

(ආ). 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 4 වගන්තිය ප්‍රකාරව වෙළඳ බලපත්‍ර මත අයකළ යුතු රු.192, 451 ක්වූ සියයට 10 ක මුද්දර බදු අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 237 (අ) සහ (ආ) ප්‍රකාරව,ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කිරීමේදී අදාල භාණ්ඩ, ගිවිසුම් ප්‍රකාරව නියමිත ගුණත්වයෙන් ගබඩාවට ලැබුණු බවට ගබඩා භාර නිලධාරියා විසින් සහතිකයක් දිය යුතු වුවත් රු.546,767 ක් වටිනා භාණ්ඩ මිලදී ගැනීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්,තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i). | වරිපනම් හා බදු | 30 | 3 | - |
| (ii). | බදු කුලී | 271 | 7, 443 | 404 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 300 | 2, 894 | - |
| (iv). | වෙනත් ආදායම් | 15, 024 | 9, 226 | 1, 380 |

**2.3.2 වරිපනම් හා බදු**

**-------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 134 (i ) වගන්තිය ප්‍රකාර සභාව විසින් බල ප්‍රදේශය තුල පිහිටි දියුණු කළ ප්‍රදේශ හදුනාගෙන වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 බදුකුලී**

---------

කඩකාමර 09 කට අදාලව වසර 10 ක් තිස්සේ හිඟව පවතින කඩ කුලී රු.301,390 ක් විය.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු |
|---|---|---|
| (i). | උසාවි දඩ | 19,313 |
| (ii). | මුද්දර ගාස්තු | 2, 352,897 |

**2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්**

**----------------------------------------------**

එකතු වටිනාකම රු.1,178,514 ක්වූ සහල් පිටි ආශ්‍රිත බේකරි නිෂ්පාදන කට්ටලය සහ ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

**------------------------------------------------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය ප්‍රකාරව රු.59,000 ක්වූ උත්සව වියදම් සඳහා විෂයභාර අමාත්‍යාවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**2.6 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

සමාලෝචිත වර්ෂයේ දී අනුමත වී තිබුණ එකතුව රු.2,000, 000 ක් පිරිවැය වූ ව්‍යාපෘති 03 ක වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණි.

**2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

(අ). ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු තනතුරු 11 ක් බඳවා ගැනීම හෝ 32 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව ස්ථිර කර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ). ඉදිරි වර්ෂවල ක්‍රියාකාරිත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාත්මක කිරිමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). වත්කම් කළමනාකරණය

(ඇ). ආදායම් පරිපාලනය